**මහවැලි ජල ආරක්ෂක ආයෝජන වැඩසටහන - අදියර 1 ව්‍යාපෘතිය - 2016**

------------------------------------------------------------------------------------------------

මහවැලි ජල ආරක්ෂක ආයෝජන වැඩසටහන - අදියර 1 ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2015 සැප්තැම්බර් 17 දින එළඹි අංක 3267 (එස්ආර්අයි) ණය ගිවිසුමේ 4.06 (අ) ව්‍යවස්ථාව සහ අංක 3268 (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 4.03 (අ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, ව්‍යාපෘති ප්‍රදේශය තුළ කෘෂිකාර්මික කටයුතු වලට හා පානය සඳහා ඇති ජල සම්පත් සඳහා ප්‍රවේශය ආරක්ෂා කිරීමයි. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,740කට සමාන එජඩො මිලියන 190ක් වන අතර ඉන් රු.මිලියන 21,900කට සමාන එජඩො මිලියන 150ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2015 ජුනි මාසයේදී ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් වන විට නිම කිරීමට නියමිතය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ

විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යා යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ(ඩොලර්) ගිණුමේ ආරම්භක තැන්පතුව, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි ද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීමට කළමනාකාරීත්වය විසින් ප්‍රමාණවත් පියවර ගත්තේ ද යන බව.

(ඔ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන් එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීමට කළමනාකාරීත්වය විසින් ප්‍රමාණවත් පියවර ගත්බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

--------------------------------------------

#### 2.2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

2016 ජූනි 15 දිනැති අංක ඩීඑම්ජ්/ඩී/2015 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය අනුව මුළු ඇස්තමේන්තුව එජඩො මිලියන 10 ඉක්මවන විදේශ ආධාර ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගත යුතුය. කෙසේ වුවද 2015 ජූනි මාසයේදී මෙම වැඩ සටහනේ කටයුතු ආරම්භ කළ අතර එහි අපේක්ෂා කළ පිරිවැය එජඩො මිලියන 190 ක් වුවද වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳව අධීක්ෂණය සඳහා විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

--------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ වර්ෂය | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසංබැ -ණය අංක 3267 | 76.00 | 11,096.00 | 970.73 | 2.90 | 437.20 | 2.90 | 437.20 |
| -ණය අංක 3268 | 74.00 | 10,804.00 | 1,518.33 | 3.60 | 526.85 | 6.20 | 859.35 |
| ශ්‍රී ලං ර | 40.00 | 5,840.00 | 560.94 | 1.70 | 244.88 | 2.20 | 316.42 |
| | 190.00 | 27,740.00 | 3,050.00 | 8.20 | 1.208.93 | 11.30 | 1,612.97 |

ලැබී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 7,550 ක වෙන්කිරීම පසුව රු.මිලියන 3,050 ක් ලෙස සංශෝධනය කිරීමට කටයුතු කර තිබුණි. එම ප්‍රතිශෝධිත ප්‍රතිපාදනයෙන් සියයට 40 ක් වන රු.මිලියන 1,208.93 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට භාවිතා කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩසටහටනේ ක්‍රියාකාරී සැලැසුම්වලට අනුකූලව, සමාලෝචිත වර්ෂය අවසානයේදී වැඩසටහනේ වැඩවලින් සියයට 19 ක් වන සමස්ථ භෞතික ඉලක්කය සපුරා ගැනීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වුවද එම භෞතික ඉලක්කය පසුකාලීනව සියයට 12.9 ක් ලෙස සංශෝධනය කර ඇති අතර, භෞතික ඉලක්කයේ තථ්‍ය සපුරා ගැනීම සමාලෝචිත වර්ෂය අවසානයේ පමණක් සියයට 7.59 ක් ලෙස පැවතුණි. ඉදිකිරීම් කටයුතු කිහිපයක් සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය ප්‍රමාද වී තිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම වැඩසටහනේ ක්‍රියාකාරී සැලසුම්වල සඳහන් අපේක්ෂිත භෞතික ඉලක්ක සමාලෝචිත වර්ෂය අවසානයේ දී ලබාගත නොහැකි විය. එම නිසා නියමිත දිනයන්හි වැඩ නිම කිරීමටත්, මිල වෙනස්වීම හේතුවෙන් පිරිවැය ඉක්මවා යාමේ හැකියාවක් නොපවතීය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය. නිරීක්ෂණය වූ අවස්ථා පහත දැක්වේ.

(i) ඉහළ ඇලහැර ඇලෙහි ඉදිකිරීම් කටයුතු වලට අදාල කොන්ත්‍රාත්තුව 2016 නොවැම්බර් 21 දින ප්‍රමාදයකින් යුතුව ප්‍රදානය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපේක්ෂිත සියයට 30 ක භෞතික ඉලක්කය ලබාගැනීමට නොහැකි විය. එමනිසා, සමාලෝචිත වර්ෂය අවසානයේදී සියයට 3.2 ක වැඩ පමණක් නිමකර තිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට සියයට 20 ක වැඩ නිමකිරීමට අපේක්ෂිත වුවද වැඩවලින් සියයට 2.3 ක් පමණක් අවසන් කර ඇති අතර, කිලෝමීටර් 5.25 ක දුර ප්‍රමාණයකින් යුත් වෙමිදිල්ල වම් ඉවුරේ ප්‍රධාන ඇල දක්වා නෙබැදගහවත්ත සහ නව සොරොව්වේ ඉදිකිරීම් හා වැඩි දියුණු කිරීමේ කටයුතු හා පිටවාන් ඇල රු. මිලියන 805.32 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව, 2016 නොවැම්බර් 21 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පමණක් සිදුවිය.

(iii) 2016 දෙසැම්බර් 31 දින අවසන් වීමට අපේක්ෂිත, පළමු අදියරෙහි කිලෝමීටර් 30.14 ක් වූ මිනිපේ වම් ඉවුරු ඇලෙහි පුනරුත්තාපන කටයුතු සියයට 30 ක ඉලක්කය සපුරාගැනීමට නොහැකි වූ අතර, 2016 සැප්තැම්බර් 07 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පමණක් සිදුකර තිබුණි.

(ආ) කිලෝමීටර් 17.25 ක් වූ ප්‍රධාන ඇල ඉදිකිරීම්වලට අදාළ මහාකිතුල ඇත්දොල උමග, මහ කිතුල සහ මහ කිතුල ජලාශ නෙබැදගහවත්ත සිට මහ කිතුල ජලාශය සමග පෝෂක ඇල ඉදිකිරීමේ ලංසු ලියකියවිලි සකස් කිරීමට අදාළ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

කෙසේ නමුත්, මිනිපේ වම් ඉවුර උමගේ අදියර 02 සහ 03 හි කිලෝමීටර් 19.76 ක පුනරුත්තාපන වැඩවල සහ ඉහත එක් එක් ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය 2016 දෙසැම්බර් 31 දිනට සියයට 30 ක් අපේක්ෂා කරන ලදී. තවදුරටත් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මිනිපේ අමුණෙහි මාර්ගය සහ වතුර පාලනයට අදාළ ලංසු ලියවිලි පිළියෙල කර තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනට මැනුම් පහසුකම් වැඩ සියයට 50 ක් සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු විය.

### 3.3 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

-----------------------------------

සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන වෙනුවෙන් දරන ලද රු.මිලියන 1327.87 ක වියදම මහා භාණ්ඩාගාරය විසින් එම වැඩසටහන වෙනුවෙන් පැවැත්වූ වාර්තා අනුව එම වියදම වූ රු.මිලියන 1576.66 ක අනුරූපී වියදම සමග එකඟ නොවීය. මහා භාණ්ඩාගාරයේ වාර්තා වලට යොදන ලද රු. මිලියන 332.50 ක් වූ ඍජු වියදම් පිළිබඳ සටහන් සහ වැඩසටහන් අධීක්ෂණ ඒකකය මගින් දරන ලද රු.මිලියන 83.71 ක්වූ වියදමක ශුද්ධ ශේෂය සටහන් කිරීම සඳහා කරනු ලැබූ ගැලපීම ඉහත වෙනසට ප්‍රධාන හේතුව විය.

### 3.4 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 177 කින් සමන්විත වූ අතර, එයින් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්, ව්‍යාපෘති ඉංජිනේරුවරුන්, ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරීන් ඇතුළු 71 දෙනෙකු 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩිකාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2016 ජූනි 17 දිනැති ලිපිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් නොවන ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු 2016 මාර්තු මාසයේදී ව්‍යාපෘතිය සඳහා වැඩ බැලීමේ පදනම මත බඳවාගෙන දීමනා ලෙස එකතුව රු. මිලියන 1.12 ක් ලෙස ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.